# දැන්වත් බ්‍රිතානිය හඳුනාගනිමු

බ්‍රිතානි පාර්ලිමේන්තුවේ සභාව කල්තැබීමේ යෝජනාවක් ලෙස ලංකාව පිළිබඳ විවාදයක් වූ බවත් ඒ විවාදය බ්‍රිතානි රජයේ ඇමතිවරයකු විසින් ආරම්භකරන ලද බවත් විවාදය අවසානයේ දී ලංකාවේ දෙමළ ජනයාට යුක්තිගරුක හා ගෞරවනීය සාමයක් ගෙනඒම සඳහා සර්වපාක්ෂික පාර්ලිමේන්තු කණ්ඩායමක් පත්කළ බවත් එහි නායකයා කම්කරු පක්ෂයේ කීත් වාස් නම් මන්ත්‍රීවරයකු බවත් දේශපාලනය ගැන උනන්දුවක් දක්වන්නන්ට රහස් නො විය හැකි ය. වැඩ වරද්දාගත් බ්‍රිතානි පාර්ලිමේන්තුව, ඒ මන්ත්‍රීවරු කිහිපදෙනකුගේ පමණක් වැඩක් බවට අමුතු පොතක් පෙරළණු දක්නට හැකි ය. එහිදී විදෙස් රටවල මෙන් ම මෙරට ද ජීවත්වන ඇතැම් සිංහලයන් ද බ්‍රිතානි පාර්ලිමේන්තුවේ ආරක්ෂාව සඳහා පෙනී සිටින්නවුන් බවට පත් වී තිබීම කණගාටුවට කරුණකි.

බ්‍රිතානි පාර්ලිමේන්තු යෝජනාව දෙමළ ජාතිවාදීන් විසින් පෙන්වාදෙනු ලබන්නේ ලංකාණ්ඩුවට විරුද්ධව ගෙනෙන ලද්දක් ලෙස ය. ඒ එසේම ය. බ්‍රිතානීන්ට දැන් අවශ්‍ය වන්නේ බලහත්කාරයෙන් හෝ ලංකාණ්ඩුව හා කොටි සංවිධානය අතර සාකච්ඡා ඇතිකිරීම ය. ඒ ඔස්සේ රනිල් වික්‍රමසිංහ මහතා අත්සන්කළ ඊනියා සටන්විරාම ගිවිසුම ක්‍රියාත්මක කරවීම ය. ඒ අතර හැකිනම් මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩුව වට්ටවා මෙරට බ්‍රිතානි සෘජු නියෝජිතයා වූ ද, බටහිරයන් වෙනුවෙන් මෙරට දී හා පිටරට දී විවිධ ප්‍රකාශ කරන්නා වූ ද රනිල් වික්‍රමසිංහ මහතාගේ ආණ්ඩුවක් පිහිටුවා දෙමළ ජාතිවාදයට ඉල්ලන සියළු දොළ පිදේනි ලබාදීම ය.

බ්‍රිතානිය ඒ බලහත්කාරකම කරන්නේ ඊනියා ආධාර දීම නතරකිරීමෙනි. තව කල්යන විට ආර්ථික තහංචි පැනවීමට ද ඔවුන් බලාපොරොත්තුවනු ඇත. මේ සියල්ලෙන් කරන්නේ ලංකාණ්ඩුව බිය වැද්දීම ය. ලංකාණ්ඩුවට තර්ජන එල්ලකිරීම ය. ලංකාණ්ඩුව මේ තර්ජනවලට හිස නොනැමිය යුතු ය. කළයුත්තේ බ්‍රිතානියට හා අනෙක් බටහිර රටවලට ඕනෑ කුදයක් ගසාගැනීමට කියා හමුදා ක්‍රියාමාර්ගවලින් කොටි පරාජයකිරීම ය. කොටි ත්‍රස්තවාදය මුළුනිපුටාදැමීම ය. ඒ නොකළ හැකි කාර්යයක් නො වෙයි. අපට තහංචි ප්‍රශ්නයක් නොවිය යුතු ය. අපට එහි දී බටහිරයන්ගේ සියළු තහංචි මැද රට කරවන මියන්මාර ආණ්ඩුව ආදර්ශයට ගතහැකි ය.

බ්‍රිතානිය ප්‍රමුඛ බටහිර රටවල් හා ඒ සමග එක්ව කටයුතුකරන ජපානය මෙහි දී උත්සාහ ගන්නේ මෙරට මානව අයිතිවාසිකම් ක්‍රමයෙන් කඩ වී යන බව කීමට ය. මානව අයිතිවාසිකම් කඩවීම හේතුවක් කරගනිමින් ආර්ථික සම්භාධක පැණවීම හා එක්සත් ජාතින්ගේ හමුදා එවීම ඔවුන්ගේ බලාපොටොත්තුව වෙයි, එහෙත් මේ මානව අයිතිවාසිකම් සාපේක්ෂ බවත් යුරෝපය සිය ක්‍රිස්තියානි නූතනත්ව සංස්කෘතිය ලොවෙහි ප්‍රධාන ම හා බලවත් ම අධිපතිවාදී සංස්කෘතිය බවට පත්කරගැනීමෙන් පසුව පමණක් මේ මානව අයිතිවාසිකම් පිළිගත් බවත් ඔවුහු අමතක කරති. එහෙත් අද පවා බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ආධිපත්‍යයට යම් ආකාරයක හෝ තර්ජනයක් එල්ලවන්නේ යැයි සිතෙන අවස්ථාවල අනෙක් අයගේ මානව අයිතිවාසිකම් කපාදමන්නේ කෙසේ දැයි ඔවුහු දනිති.

පසුගියදා බ්‍රිතානිය, ප්‍රංශය ආදී රටවල මුස්ලිම් කාන්තාවන් සම්පූර්ණයෙන් ම මෙන් තම සිරුර වසමින් අඳින ඇඳුමට තහංචි පැනවිණි. එසේ තහංචි පැනවීමේ දී ඔවුන් යොදාගත්තේ ද එක්තරා අයුරකින් ගතහොත් මානව අයිතිවාසිකමකි. මුස්ලිම් කාන්තාවන් එසේ සම්පූර්ණයෙන් ම මෙන් සිරුර වසා සිටින විට ඔවුන් කතාකරන්නේ කුමක් දැයි තේරුම්ගැනීම අනෙක් අයකුට අපහසු බව ඔවුහු පැවසූහ. එනම් අනෙක් තැනැත්තාට මුස්ලිම් කාන්තාවක් පවසන දෙය තේරුම්ගැනිමට ඇති අයිතිය කෙරෙහි ඔවුහු අවධානය යොමුකළහ. එමෙන් ම එය මුස්ලිම් කාන්තාවන්ගේ පැත්තෙන් ද බලා ඒ ඇඳුම හේතුවෙන් ඒ කතුන් පවසන දෙය නිසියාකාරව සන්නිවේදනය කළනොහැකි බව ද ඔවුහු පෙන්වා දුන්හ.

එසේ ගත්විට මුස්ලිම් කාන්තාවන්ට ඔවුන්ගේ සාම්ප්‍රදායික ඇඳුමට තහංචි පැනවූයේ මුස්ලිම් කාන්තාවන්ගේ ම යහපතට ඔවුන්ගේ භාෂණ අයිතිය රැකීමට යැයි පෙන්වා දිය හැකි ය. එහෙත් සිදුවූයේ මුස්ලිම් කාන්තාවන්ගේ හෝ ඔවුන්ට සවන් දෙන්නන්ගේ හෝ ඊනියා මානව අයිතියක් රැකීමක් නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් මුස්ලිම් අනන්‍යතාවට එරෙහිව තහංචි පැනවීම ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙනත් කිසිම සංස්කෘතියකට ඉඩ දීමට

© Prof. Nalin De Silva

සුදානම් නැත. බොරු කතා ඔස්සේ අනෙක් සංස්කෘතීන්ට ගරුකරන බව පැවසුව ද යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අවශ්‍ය වී ඇත්තේ අනෙක් සංස්කෘතීන් නැතිකිරීම ය. මුස්ලිම් අනන්‍යතාව ප්‍රදර්ශනයකිරීම වැන්නක් පවා තම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට තර්ජනයක් යැයි මුළු ලොවේ ම ආධිපත්‍යය දරණ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විශ්වාස කරයි.

මෙරට මානව අයිතිවාසිකම් යනුවෙන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් සැලකෙන්නේ ද යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට සාපේක්ෂ මානව අයිතිවාසිකම් ය. අපේ රට බෞද්ධ රටක් යැයි කීමට විරුද්ධවන්නේ එමගින් බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ඒකාධිකාරියට තර්ජනයක් එල්ලවන බැවින් මිස වෙනත් කරුණක් නිසා නො වෙයි. අපට සම්පූර්ණ නිදහසක් නොදීමට බටහිරයන් කටයුතුකරන්නේ ද තම ආධිපත්‍යය පවත්වාගෙන යෑමට ය. අපේ රටේ ස්වෛරීභාවයට එරෙහිව දෙමළ ජාතිවාදී ත්‍රස්තවාදීහු කටයුතු කරති. ඔවුන්ට දවුවම් දීමට, ඔවුන් විනාශකිරීමට, ඔවුන් පරාජයකිරීමට අපට අවශ්‍ය වෙයි. අප එය කරන්නේ කෙසේ ද?

එහි දී අප යොදාගත යුත්තේ බටහිරයන් තම රටවල ක්‍රිස්තියානි ආධිපත්‍යය පිහිටුවාගැනීමෙන් පසු සකස් කළ නීති රීති පද්ධතිය ද? ඒ නීති රීති පද්ධතිය බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය රැකගැනීම සඳහා සකස්කළ එකක් පමණකි. ඒ නීති යොදාගෙන අපට කිසි දිනෙක ස්2වරී රාජ්‍යයක් ලෙස කටයුතුකිරීමට නො හැකි ය. බටහිරයන්ගේ නීතිය ක්‍රියාත්මක වන්නේ  සිංහලත්වයට එරෙහිව ය. නීතියේ ඇති සාපේක්ෂ බව මෙරට සිටින බටහිර අධ්‍යාපනයක් ලැබූ ඇතැමුනට නොතේරෙනවා විය හැකි ය. ඊනියා යථාර්ථයක් ඇතැයි ද, වාස්තවික සත්‍යයක් ඇතැයි ද ආදී වශයෙන් බොරු උගන්වන බටහිර අධ්‍යාපනය අවසානයේ දී කියන්නේ ඒ ඊනියා යථාර්ථය බටහිර ක්‍රිස්තියානි විද්‍යා අධ්‍යාපනයෙන් පමණක් ලබාගත හැකි බව ය. මෙතරම් පට්ටපල් බොරුවක් ලෝකයේ කිසිම දිනක කියවී ඇතැයි සිතිය නො හැකි ය. දැනුමේ සාපේක්ෂ බව තේරුම් ගත්විට නීතිය ද සාපේක්ෂ බව තේරුම් ගැනීම අසීරු නො වෙයි. නීති යන්නෙහි පදනමෙහි ම ඇත්තේ යුදෙව්වන් දෙවියන් වහන්සේ සමග ඇතිකරගන්නා ලදැයි කියන ගිවිසුම ය.

ඒ කෙසේ වෙතත් අද ඇතැමුන් පැවසීමට තැත්කරන්නේ බ්‍රිතානි පාර්ලිමේන්තුවේ ඇති වූ විවාදයට එරට ආණ්ඩුවේ සම්බන්ධයක් නැති බව ය. බ්‍රිතානි ආණ්ඩුවේ කටයුතු දන්නා අයට මේ විහිළුවකි. විවාදය පැවැත්වූයේ නිකම් මන්ත්‍රී කණ්ඩායමක අවශ්‍යතාව නිසා යැයි කීමට තරම් අප බොළඳ නොවිය යුතු ය. විවාදය ඇරඹූයේ කම්කරු පක්ෂ ආණ්ඩුවේ ඇමතිවරයෙකි. මේ පිටුපස බ්‍රිතානි ආණ්ඩුව වෙයි. මෙය මුට්ටිය දැමීමකි. අප මුට්ටිය පොඩි පට්ටම් කළ යුත්තේ මුට්ටිය පිටුපස සිටින්නා හඳුනාගනිමිනි. මේ මුට්ටිය හොඳ ප්‍රජාතන්ත්‍රවාදී මුට්ටියක් යැයි කියමින් අප එය පිළිගතහොත් බ්‍රිතානි ආණ්ඩුව ද ඊනියා මානව අයිතිවාසිකම් අවියක් කරගනිමින්  මුට්ටිය පසුපස එනු ඇත. බටහිර මුට්ටිවල තිබුණත් තිබිය හැක්කේ අනෙක් සංස්කෘතීන්ට කිසිම ඉඩක් නොදෙන බටහිර ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදය පමණකි. ඒ බිඳ දැමීමට අප දෙවරක් සිතිය යුතු නො වෙයි. ඉතා අහිංසක, අපක්ෂපාත, අදේශපාලනික දැනුම් පද්ධතියක් ලෙස පෙනෙන බටහිර ගණිතය ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි උපත ලබා ඇති විට බටහිර නීතිය ඇතුළු අනෙක් බටහිර විෂයවල අපක්ෂපාති බව ගැන කතාකිරීමට තරම්වත් දෙයක් නැත.

අද ඇතැම් සිංහලයන් විශේෂයෙන් ම බටහිර රටවල වෙසෙන ඇතැමුන් සිතන්නේ දෙමළ කොටි ත්‍රස්තවාදීන් කිහිප දෙනකු එකතු වී බ්‍රිතානි මන්ත්‍රීවරු කිහිප දෙනකු මුළාකර අදාළ යෝජනාව  සම්මත කරගත් බව ය. ඔවුන්ට ඒ රටවල ජීවත්වීම සඳහා එවැනි සිහිනයක් අවශ්‍යවීම අපට තේරුම්ගත හැකි ය. එහෙත් රටක් ජාතියක් ලෙස ගත්කල අපට ඒ සිහින හුදෙක් දවල් සිහින පමණක් වෙයි. දෙමළ ත්‍රස්තවාදීන්ට ලෝකය පුරා සිංහලයන්ට විරුද්ධව මතයක් ප්‍රචාරයකිරීමට සියළු පහසුකම් සපයා දුන්නේ මූලික වශයෙන් ම බ්‍රිතානිය ය. මතය නිර්මාණය කළෝ බ්‍රිතානීහු ය. බ්‍රිතානි මන්ත්‍රීන් ඉතා ටික දෙනකුට කරුණු පැහැදිලිකර දෙමළ ත්‍රස්තවාදී ප්‍රශ්නය ගැන අවබෝධයක් සිංහලයන්ගේ පැත්තේ සිට ලබාදිය නොහැකි යැයි නො කියමි. එහෙත් බ්‍රිතානි ආණ්ඩුවට එවැනි අවබෝධයක් ලබාදීමට නො හැකි ය. මුළු මහත් දෙමළ ජාතිවාදී ප්‍රශ්නය ම බ්‍රිතානීන්ගේ නිර්මාණයක් වෙයි. ඔවුහු සිංහලත්වයට එරෙහිව බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙනුවෙන් ඒ නිර්මාණය කළහ. අදවත් අපි ප්‍රශ්නය කුමක්දැයි අවබෝධකරගැනීමට උත්සාහ ගනිමු. ප්‍රශ්නයට විසඳුමක් දියහැක්කේ ප්‍රශ්නය කුමක්දැයි අවබෝධකරගැනීමෙන් පමණකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva